චක්‍රලේඛ අංක:- EPS/2024/34 - 1

මගේ අංකය :- PE/101/2024
මැතිවරණ මහලේකම් කාර්යාලය.
සරණ මාවත,
රාජගිරිය.
2024.11.06

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2024.10.26 ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**
**මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක EPS/2024/34 හා 2024.10.27 දිනැති චක්‍රලේඛයේ 7.1 හා 7.5 ඡේද කෙරෙහි අවධානය යොමු කරවමි.

02. අදාළ ඡේද පහත පරිදි සංශෝධනය කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

7.1 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ මැතිවරණ රාජකාරීවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | ගෙවිය යුතු දීමනාව රු. | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| කලාප භාර/ කොට්ඨාසභාර සහකාර තේරීම්භාර නිලධාරී | 6,000.00 | CE 46 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්ද පොල) | 6,000.00 | CE 19/1 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්ද පොල) | 5,000.00 | CE 19<br>CE 19/1 |
| විශේෂ/ අතිරේක කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්ද පොල) | 3,500.00 | CE 19 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ලිපිකරු (ඡන්ද පොල) | 3,250.00 | CE 19 |
| කාර්යාල කාර්ය සහායක (ඡන්ද පොල) | 3,000.00 | CE 19 |

7.5 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ (ගණන් කිරීමේ නිලධාරීන් සඳහා L.B.E.33 දරන ආකෘතියේ වූ පත්වීමකට) ඡන්ද ගණන් කිරීමේ රාජකාරීවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | දීමනාව රු. | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| ඡන්ද ගණන් කිරීමේ කාර්යය අධීක්ෂණ කලාප/ කොට්ඨාස සහකාර තේරීම්භාර නිලධාරී | 7,000.00 | CE 50 |
| ගණන් කිරීමේ නිලධරයා/ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 6,000.00 | CE 54 |
| අතාරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (තැපැල් ඡන්ද) | 6,000.00 | CE 54 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 5,000.00 | CE 49 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ලිපිකරු | 4,000.00 | CE 49 |
| *කාර්යාල කාර්ය සහායක | 3,000.00 | CE 49 |

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :- 1. විගණකාධිපති - දැන ගැනීම පිණිස
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
3. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්
} දැන ගැනීම පිණිස හා චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා

G:\Hansi\1. ඇල්පිටිය\චක්‍රලේඛ\2024.10.16 - 1 අමාත්‍යාංශ, සභාපති ගෙවීම්.docx